**<u>ශ්‍රී ලංකා පරිපාලන සේවයෙහි II ශ්‍රේණියේ නිලධාරීන්</u>**

**<u>I ශ්‍රේණියට උසස් කිරීම</u>**

අංක 1842/2 හා 2013.12.23 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අංක 2137/5 හා 2019.08.19 දිනැතිව කරන ලද හයවන සංශෝධනය හා 2019.10.04 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 31/2019 හි විධිවිධාන පරිදි, 2013.05.02 දිනැතිව ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවාගෙන ඇති නිලධාරීන්, I ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. **I ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් හා උසස් කිරීමේ ක්‍රමය**

පහත සුදුසුකම් සම්පූර්ණ කරන ලද II ශ්‍රේණියේ නිලධරයන් I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයකින් පිරිනමනු ලබන රාජ්‍ය පරිපාලනය, කළමනාකරණය, රාජ්‍ය ප්‍රතිපත්ති, මානව සම්පත් කළමනාකරණය, ආර්ථික විද්‍යාව, සංවර්ධන ආර්ථික විද්‍යාව, සමාජ සංවර්ධනය, නීතිය, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපෘති සැළසුම්කරණය හා කළමනාකරණය, තොරතුරු තාක්ෂණය යන විෂය ක්ෂේත්‍රයන්ගෙන් හෝ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්ට පැවරෙන බහුවිධ කළමනාකරණ කාර්ය භාරය ඉටු කිරීම පිණිස අවශ්‍ය දැනුම හා කුසලතාවය ලබා ගැනීම සඳහා යෝග්‍ය යැයි ශ්‍රී ලංකා පරිපාලන සේවා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන වෙනත් විෂය ක්ෂේත්‍රයන් අතුරින් හෝ අවම වශයෙන් එක් විෂය ක්ෂේත්‍රයකට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම.

II. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හය (06)ක් උපයාගෙන තිබීම

III. අනුමත කාර්යසාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සම්පූර්ණ කර තිබීම.

V. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වනු ලබන ධාරිතා සංවර්ධන මට්ටම III පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.

VI. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුව විනයානුකූල දඬුවම් ලබා නොතිබීම.

03. ඉහත 02 හි සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් මේ සමග වන ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් පහත ලිපිනයට 2025.06.02 දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය.
(සැ.යු. : දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවයේ නියුතු නිලධරයන් ස්වදේශ කටයුතු අංශය මඟින් අයදුම්පත් යොමු කිරීමට කටයුතු කළ යුතුය.)

අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ප.සේ.)
ශ්‍රී ලංකා පරිපාලන සේවා අංශය
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

04. උසස් කිරීම සඳහා අදාළ ඉල්ලුම්පත "ඇමුණුම 01" මඟින් ඉදිරිපත් කර ඇති අතර එහි මෘදු පිටපත පහත දැක්වෙන පරිදි රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය.

www.pubad.gov.lk → සේවා → ශ්‍රී ලංකා පරිපාලන සේවය → බාගත කිරීම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

දිනය : 2025.04.30

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
දුරකතන : 011-2698605
ෆැක්ස් : 011-2683651
විද්‍යුත් ලිපිනය: pubad.dslas@gmail.com